දැන්වීමයි

කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා වන සීමිත බඳවාගැනීම - 2026

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) **ප්‍රාථමික අර්ධ ශිල්පීය** තනතුරු සඳහා සුදුසුකම්ලත් **අභ්‍යන්තර අයදුම්කරුවන්** වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) ප්‍රාථමික සේවා ගණයේ සේවකයින් සඳහා ඉල්ලුම් කල හැකිය. මෙම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මේ සමඟ දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව, A4 ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙල කරගත් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ **2026.07.31** දිනට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

I. තනතුරු නාමය :- බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) ප්‍රාථමික අර්ධ ශිල්පීය III ශ්‍රේණිය

1. වීදුලි කාර්මික
2. පෙදරේරු
3. වඩු කාර්මික
4. පැස්සුම්කරු
5. වැද්දුම්කරු
6. ලියවන පටවල් යන්ත්‍ර ක්‍රියාකරු
7. කාර්මික
8. මෝටර් කාර්මික
9. ලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරු
10. ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියාකරු
11. ආදාහනාගාර ක්‍රියාකරු
12. බෙලෙක්කරු
13. තර්මොප්ලාස්ටික් යන්ත්‍ර ක්‍රියාකරු
14. සංඥා පුවරු ලියන්නා
15. කම්බි නැවුම්කරු
16. පොම්ප මධ්‍යස්ථාන ක්‍රියාකරු
17. එක්ස්කැවේටර් ඔපරේටර්
18. වීදුලි බලස්ථාන සහයක/සේවක
19. වීදුලි ජනක යන්ත්‍ර ක්‍රියාකරු
20. ප්‍රිමික්ස් පේවර් ඔපරේටර්
21. වාහන වීදුලි කාර්මික
22. වාහන පින්තාරුකරු
23. සැහැල්ලු යන්ත්‍ර ක්‍රියාකරු
24. ජලනල කාර්මික
25. ඇස්පෝල්ට් මිලිං මැෂිං ඔපරේටර්
26. ඇස්පෝල්ට් ප්ලාන්ට් ක්‍රියාකරු
27. බිටුමන් ස්ප්‍රේමන්
28. පින්තාරුකරු
29. ඇස්පෝල්ට් පවර් ස්ක්‍රෑමන්ට්
30. ඇස්පෝල්ට් මිලිං මැෂිං ලෙවලර්
31. ටයර් වැද්දුම්කරු
32. ඩ්‍රිලිං යන්ත්‍ර ක්‍රියාකරු
33. සේවා නඩත්තුකරු
34. පොරෝදුකරු
35. කම්මල්කරු
36. මිලිං මැෂිං ඔපරේටර්
37. මෝටර් වීදුලි කාර්මික
38. ඔබඩාකරු
39. ජල වැද්දුම්කරු
40. වාහන බෙලෙක්කරු
41. යන්ත්‍ර ක්‍රියාකරු
42. යන්ත්‍ර ක්‍රියාකරු (සතුටු උයන)
43. අරක්කැමි
44. භූමික මළනාලිකා කම්කරු

II. බඳවාගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

III. වැටුප් පරිමාණය :- PL 2 - 2025 (රා.ප.ව 10/2025 අනුව)
රු.41,800 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 65,560/-

IV. වයස් සීමාව :- දැනටමත් පළාත් සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමා අදාළ නොවේ.

V. නතනුරට අදාළ අධ්‍යාපන, වෘත්තීය, වෙනත් සුදුසුකම් හා පලපුරුද්ද :-

අධ්‍යාපන සුදුසුකම්	වෘත්තීය සුදුසුකම්	පලපුරුද්ද	වෙනත් සුදුසුකම්
අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දොරක් සහිතව විෂයයන් තුනක් සමත්ව තිබීම. (මීන් විෂයන් පහක් එකවර සමත් විය යුතුය)	අදාල නතනුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය සුදුසුකාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබාගෙන තිබීම හෝ අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ මාස 06 කට නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම. (සහතික මිණින් සනාථ කල යුතුය)	අදාල පලාත් පාලන ආයතනයක ප්‍රාථමික ශ්‍රේණියේ නතනුරක සේවය ස්ථිර කර ඇති සේවා කාලය වසර 5 සපුරා ඇති හා අදාල කාර්යක්ෂමතා කඩඉම සමත්, වසර 5ක සතුටුදායක සේවා කාලය සපුරා ඇති සේවකයකු විය යුතුය.	බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, නතනුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම. කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසාන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම

VI. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පත්නා පුරප්පාඩු සඳහා බඳවාගැනේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
බඳවාගැනීමේදී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම් වලට අමතර ලබාගෙන ඇති අධ්‍යාපන සුදුසුකම්	20	50%
නතනුරට අදාල ප්‍රායෝගික දැනුම	75	
පෞරුෂත්වය	05	

VII. මෙම නතනුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

VIII. අයදුම්කරනු ලබන නතනුර අයදුම්පතෙහි පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එක් අයදුම්කරුවකු එක් නතනුරකට වඩා අයදුම්කරනු ලබන්නේ නම්, එම එක් එක් නතනුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

IX. නතනුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන, **අයදුම්පත් කැඳවන අවසාන** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය. 2026.07.31 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් වල අත්හැරීම් හා ප්‍රමාද දෝෂයන් පිළිබඳ වගකීම ඒ ඒ දෙපාර්තමේන්තුව වෙත පැවරේ.

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමිසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

ඒ.ඩී.එස්.රෝහණ,
නාගරික කොමිසාරිස් (රා.ඉ),
කොළඹ මහා නගර සභාව.

2026 ජූලි මස 14.. වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමිසාරිස් කාර්යාලයේදිය.